**බලන්ගොඩ නගර සභාව**

**2021-12-31 වන දිනැති අයවැය නැවත ඉදිරිපත් කිරීම සම්බන්ධ**

**විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව**

**ස්ථානය - බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2021.12.31**

**වේලාව - පෙ.ව. 10.30**

**බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

**නිලධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්.එච්.ඒ.කරුණාරත්න මිය |

මෙදින විශේෂ මහ සභාවේ වැඩ කටයුතු පෙ.ව. 10.30 ට ආරම්භ කළ ගරු සභාපතිතුමන් 2022 වර්ෂයේ අයවැය ලේඛනය නැවත ඉදිරිපත් කිරීමේ විශේෂ මහ සභාව සඳහා සහභාගී වූ ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා, සබරගමු පළාත් සභාවේ විමර්ශන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගත් අතර, ආගම සිහි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙවැනි ප්‍රශ්නකාරී, අපහසු අවස්ථාවකට මෙම සභාව මුහුණ දී සිටින පරිසරයක 2015 වර්ෂයේ සභාවේ පැවති තත්ත්වය සියලු දෙනාම මෙනෙහි කර ගන්නා ලෙස ද එම කාලයේ දී පොදු ජන එක්සත් පෙරමුණ හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙකු, ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා සහ තමන් එම අත්දැකීමට මුහුණ දුන් බව ද විශාල පිරිසක් එකරැස් වී අවි ආයුධ රැගෙන සිටි අතර, හිටපු ගරු උප සභාපතිතුමා පිහියක් පවා රැගෙන පැමිණ සිටි නමුත් අද බලපෑම්, කඩාකප්පල් කිරීම් ඇතුළු විශාල බාධක රැසක් මධ්‍යයේ සභාපතිවරයෙක් වශයෙන් තමන් තනියම පැමිණ නොසැලී, නොබියව අභියෝගවලට මුහුණ දී සභාවේ කටයුතු කිරීමට හැකි වීම සම්බන්ධව නිහතමානීව සතුටු වන බව ද සිල්ලර කාසි බරින් වැඩි අතර, එකතු කළ විට සද්ද වැඩි නමුත් වටිනාකම අඩු බව ද මුදල් නෝට්ටු බරෙන් අඩු අතර, එක් නෝට්ටුවකින් සිල්ලර කාසි රැසක වටිනාකම ඇති නමුත් සද්ද අඩු බව ද පවසමින් අද දිනට යෙදුණු විශේෂ මහ සභාවේ කටයුතු ආරම්භ කරන බව පවසන ලදී.

2021-12-14 වන දින තමන් විසින් 2022 වර්ෂයට අදාළ අයවැය ලේඛනය ගරු සභාවට ඉදිරිපත් කරන්නට යෙදුන අතර එකී අයවැයට එක් සභිකයෙකු විසින් ගෙනෙන ලද සංශෝධන යෝජනාව සභාව විසින්ම පරාජය කිරීමෙන් අනතුරුව එකී අයවැය ලේඛනයට සංශෝධන අවශ්‍ය නොවන බවට යෝජනාවක් සභාවේ බහුතරයෙන් සම්මත වීම තුළ සංශෝධන රහිතව තමන් විසින් ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනය සභාවේ සම්මත වූ නමුත් CLG/AD/1 සහ 2021.12.15 දිනැතිව පළාත් පාලන කොමසාරිස් විසින් විශේෂ සභා රැස්වීමකදී අයවැය ලේඛනය සභාව වෙත ඉදිරිපත් කර ඡන්ද විමසීමකට අවස්ථාව ලබාදෙන ලෙස දන්වා ඇති අතර, පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/AD/1/10/2 සහ 2021.12.24 යන දින දරණ ලිපි මඟින් ද අයවැය ලේඛනය නැවත සභාවට ඉදිරිපත් කරන ලෙස විවිධ උපදෙස් ලබා දී තිබුණු බව ද පැවසූ ගරු සභාපතිතුමා, විධිමත් පරිදි සම්මත වූ අයවැයක් නැවත සභාවට ඉදිරිපත් කරන ලෙස තමන් හට උපදෙස් ලබා දෙනුයේ කුමන කරුණක් අරුත්වද යන්න තමන් නොදන්නා නමුත් තමා වෙත ලබා දෙන නීත්‍යානුකුල නොවන උපදෙස් ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකුල නොවන බව දන්නා බව ද 2021.01.18 හෝ 19 දින තමා වෙත ද්වේශ සහගත ලෙස චෝදනා පත්‍රයක් ඉදිරිපත් කරමින් ධූරයෙන් නෙරපා හැරීමට ගත් උත්සාහය ව්‍යවර්ථ වීම තුළ නැවත වරක් තමන් කෙසේ හෝ ධූරයෙන් නෙරපා හැරීමට සිදු කරන්නා වූ ක්‍රියාවලියේ එක් අවස්ථාවක් උදාකර ගැනීමට දරන ලද ප්‍රයත්නයක්ද යන්න පිළිබඳව තමන් හට ඇත්තේ ප්‍රශ්නාර්ථයක් බව ද පැවසීය.

එමෙන්ම කරුණු කෙසේ වුවද නීත්‍යානුකුල නොවන උපදෙස් ක්‍රියාත්මක කිරීම තුළ නීත්‍යානුකුල ඵලයක් හට නොගන්නා බවද එසේම නීත්‍යානුකුලව සිදු වූ ක්‍රියාවලියට එමගින් අගතියක් සිදු නොවන බවද පෙන්වා දෙමින් පළාත් පාලන කොමසාරිස්වරයා විසින් උපදෙස් දෙනු ලැබූ පරිදි අද දින සම්මත වූ අයවැය ලේඛනය නැවත ඉදිරිපත් කරන බව ද ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා, 2021-12-14 දින සම්මත වූ අයවැය ලේඛනය ඉදිරිපත් කර තිබෙන බැවින් එම අයවැය සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා ගරු සභාවට අවස්ථාව සලසා දෙන බව පැවසීය.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා, පළාත් පාලන කොමසාරිස්තුමා විසින් අයවැය සම්බන්ධ ඡන්ද විමසීමක් සිදු කරන ලෙස ලිපියක් එවා ඇති අතර, එය ගරු සභාපතිතුමා පිළිගන්නවාද නැද්ද යන්න නොදන්නා නමුත් ගරු සභාව පිළිගන්නා බව ද එම නිසා 2002 වර්ෂයට අදාල අයවැය සම්මත කර ගැනීම සඳහා පක්ෂව හා විපක්ෂව බෙදීමක් ඉල්ලා සිටින අතර, බහුතරයෙන් සම්මත කර ගන්නා ලෙස යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් පසුගිය සභාවේ අයවැය සම්මත වූ අවස්ථාවේ දී සම්මත වූ අයවැයට බෙදීමක් ඉල්ලා යෝජනාවක් ඉදිරිපත් නොකළේ ඇයිදැයි ප්‍රශ්නයක් තිබෙන බව පැවසීය.

මේ සම්බන්ධව පිළිතුරු ලබා දුන් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා, එදින ඉල්ලීමක් කිරීමට පෙර ගරු සභාපතිතුමා අයවැය සම්මත වූ බවට පවසා සභාවෙන් පිට වූ බව ද එබැවින් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් නියෝජිත කණ්ඩායමක් එවා ඇති බව ද ගරු සභාව නොමඟ නොයවන ලෙස ද පවසන ලදී.

මෙම අවස්ථාවේ දී සභාවේ කෑ කෝ ගැසීමක් ඇති විය.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, නීත්‍යානුකූල නොවන උපදෙස් ලෙස පවසන්නේ කුමක් දැයි ගරු සභාපතිතුමාගෙන් විමසන ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් සම්මත වූ අයවැයකට නැවත ඡන්ද විමසීමක් අවශ්‍ය නොවන බැවින් ලබා දී ඇති උපදෙස් නීත්‍යානුකූල නොවන බව ද ක්‍රමවේදයකට අනුව කටයුතු කළ යුතු බව ද පසුගිය සභාව නීත්‍යානුකූල නොවන බවට හෝ බල රහිත කර ලිපියක් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එවා ඇත්නම් එය පෙන්වා දෙන ලෙස උගත් බුද්ධිමත් යැයි කියාපාන්නා වූ සභිකවරුන්ගෙන් ඉල්ලා සිටින බව ද පැවසීය.

මෙහි දී ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා අදහස් දක්වමින් තර්ක විතර්ක අවශ්‍ය නොවන බව ද 2022 අයවැය ගරු සභාපතිතුමන් විසින් පසුගිය සභාවේ දී ඉදිරිපත් කළ අතර, එහි දී සංශෝධනයට විරුද්ධව හා සංශෝධනයන් අවශ්‍ය නොවන බවට ඡන්දය ප්‍රකාශ වූ බව ද අය වැය සඳහා ඡන්ද විමසීමක් ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ඉල්ලා සිටි නමුත් එම අවස්ථාවේ දී ගරු සභාපතිතුමා සභාවෙන් පිටව ගිය බැවින් එය ලබා ගැනීමට නොහැකි වූ බව ද පළාත් පාලන කොමසාරිස්තුමාගේ ලිපිය අනුව ඡන්ද විමසීමකට ගොස් සහෝදරයන් වශයෙන් සමගියෙන් මෙම කාර්යය අවසන් කරන ලෙස ද සියලුම කටයුතු නීත්‍යානුකූල විය යුතු බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා, ඡන්ද විමසීමකට යොමු කර නොමැති බව නිරීක්ෂණය වන බැවින් නැවත විධිමත්ව අයවැය ලේඛනය සභාවට ඉදිරිපත් කර ඡන්ද විමසීමකට

අවස්ථාව ලබා දී 2022 වර්ෂයේ අයවැය සම්මත කර ගන්නා ලෙස පළාත් පාලන කොමසාරිස්තුමාගේ ලිපියේ සඳහන්ව ඇති බව පැවසීය.

මෙහි දී ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් එම ලිපියේ බළන්ගොඩ නගර සභාවේ නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මහතා සහ තවත් නාගරික මන්ත්‍රීවරුන් 09 දෙනෙකු අත්සන් කර ඉදිරිපත් කර ඇති ඉල්ලීම පරිදි යැයි සඳහන් කර ඇති බව ද සභාවේ කටයුතු නිරීක්ෂණය සඳහා දේශපාලන අතපෙවීම් මත නිරීක්ෂණ කණ්ඩායමක් එවා ඇති බව ද එය ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා පසුගිය සභාවේ දී ප්‍රකාශ කළ බව ද පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එවන ලද ලිපියේ 06 වන ඡේදයේ අයවැය සම්මත බවට සඳහන් කර ඇති බව ද පවසන ලදී.

අනතුරුව ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද, රහස් ඡන්දයක්ද යන්න යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහි දී විවෘත ඡන්දයකට යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ අනුව පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව ගරු සභිකයින් කිසිවෙකු ඉදිරිපත් නොවූ අතර, විපක්ෂව ගරු සභිකවරුන් දස දෙනෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රි | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ද |

නීත්‍යානුකූලව සභාවේ සම්මත වූ අයවැය ලේඛනයක් බැවින් ඡන්දයෙන් වැළකී සිටින බවට ගරු සභිකවරුන් හය දෙනෙකු එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |

4. ගරු නාගරික මන්ත්‍රී එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා
5 ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය
6. ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය යන අයද

ඡන්දය ප්‍රකාශ කළ අතර, සභාවට නොපැමිණි ගරු සභිකයින් එක් අයෙකු ද එනම්,

01.ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා වේ.

ගරු සභාපතිතුමා, පළාත් පාලන කොමසාරිස්තුමාගේ ඉල්ලීම මත නැවත වරක් අයවැය ලේඛනය ඉදිරිපත් කළ අතර, එහි දී අයවැය සඳහා විපක්ෂව ඡන්ද 10 ක්, ඡන්දයෙන් වැළකී සිටීම් 06 ක් හා නොපැමිණි එක් සභිකයෙක් වශයෙන් වාර්තා වන බව ද වැඩි ඡන්ද 04 ක් අයවැයට විරුද්ධව ප්‍රකාශ වී ඇති බව ද පැවසීය.

මෙහි දී ගරු සභාපතිතුමා, අදහස් දක්වමින් පළාත් පාලන කොමසාරිස්තුමාගේ ඉල්ලීම පරිදි නැවත අයවැය ලේඛනය ඉදිරිපත් කළ අතර, සම්මත වූ අයවැයක් සමඟ 2022 වර්ෂය සඳහා යා යුතු බව ද එසේ සම්මත වූ අයවැයක් තිබෙන නමුත් ඒ සඳහා විරුද්ධ වූ බව ද සාධාරණව විරුද්ධ වන්නේ නම් 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධි විධාන) පනත අනුව අනිවාර්යෙන්ම විකල්ප අයවැයක් තිබිය යුතු බව ද අයවැය සම්මත කිරීමට විරුද්ධ වූ ගරු මන්ත්‍රීවරුන් පවසන පරිදි 2022 වර්ෂයේ සම්මත නොවූ අයවැයක් සමඟ යා නොහැකි බැවින් විකල්ප අයවැයක් මෙම මොහොතේ ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලෙස ද ඉල්ලා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා, එවැනි වගන්තියක් නොමැති බව පවසන ලදී.

ඒ සම්බන්ධව ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් පනත හෝ එහි වගන්ති හෝ වාක්‍ය තේරුම් නොගන්නේ නම් එයින් විෂය සම්බන්ධව පවතින දැනුවත්භාවය පැහැදිලි වන බව පැවසීය.

නැවත වරක් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා, කුමක් කළ යුතුදැයි පළාත් පාලන කොමසාරිස්තුමා තීරණය කරන බව පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුවේ එසේ නම් පළාත් පාලන කොමසාරිස්තුමා සභාව පවත්වාගෙන යාමට සිටීම ප්‍රමාණවත් වන අතර, ඒ සඳහා ගරු සභාව හෝ ජනතා බදු මුදලින් නඩත්තු වෙන ගරු මන්ත්‍රීවරු අවශ්‍ය නොවන බවයි.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ලද උපදෙස් මත අද දින තමන් විසින් නැවත 2022 වර්ෂයට විධිමත් පරිදි සම්මත වූ අය වැය ලේඛනය ඉදිරිපත් කළ අතර, එය සභාවේ වැඩි ඡන්ද 04 කින් ප්‍රතික්ෂේප කිරිමට සභිකයන් විසින් කටයුතු කළ බව ද තමන් විසින් ඉදිරිපත් කරන ලද අයවැය ලේඛණය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඒ සඳහා වූ විකල්ප අයවැය ලේඛනයක් සභිකයන් විසින් ගරු සභාවට ඉදිරිපත් කල යුතු වුවත් අද දින එම විකල්ප අයවැය ඉදිරිපත් කිරිමක් සිදු නොවුනු

බව ද මෙකී ක්‍රියාවලිය හුදෙක් අයවැය ලේඛණයේ වූ දෝෂයක් හෝ අඩුපාඩුවක් හේතුවෙන් නොව හුදෙක්ම දේශපාලනික අරමුණක් මුදුන් පමුණුවා ගැනීමට කරන ලද ප්‍රයන්තයක් සේම තමන් බලහත්කාරයෙන් ධූරයෙන් නෙරපීමට ගත් බොළඳ ප්‍රයත්නයක් සේ පැහැදිලි වන බව ද පවසන ලදී.

එමෙන්ම 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධි විධාන) පනතේ 12 වන වගන්තිය කෙරෙහි නැවතත් අවධානය යොමු කරවන අතර එකී පනතින් ප්‍රතිපාදන සපයා ඇත්තේ සභාපතිවරයාට සහභාගිත්ව අයවැයක් සකස් කිරීම උදෙසා විනා සභාපතිවරයා ද්වේශසහගත ලෙස නෙරපා හැරීමට නොවන බව නැවතත් සිහිපත් කරන බව ද එසේම ව්‍යවස්ථාදායකයේ අරමුණ කුමක්දැයි වටහා ගන්නා ලෙස මෙහි සිටින උගත් බුද්ධිමත් යැයි කියාගන්නා සභික මහත්ම/මහත්මියන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටින බව ද එසේම සම්මත කරන ලද අයවැය ලේඛණයට සිදු කරන ලද ඡන්ද විමසීම තුළින් කිසිඳු බලපෑමක් සිදු නොවන බවද පෙන්වා දෙන අතර 2022 අයවැය ලේඛණය දැනටමත් සම්මත වී අවසන්ව ඇති බවත් එකී අයවැය ලේඛනය අනුව 2022 වර්ෂයේ කටයුතු ආරම්භ කිරීමට සූදානම් වන ලෙස කාරුණිකව දන්වන බව ද පවසමින් අද දින සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා මන්ත්‍රී මණ්ඩලය ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලය, පළාත් සභාවෙන් දේශපාලන බලපෑම් මත පැමිණි සියලු නිළධාරීන් හා මාධ්‍යවේදීන් සඳහා ස්තුතිය කරමින් සභාවේ වැඩ කටයුතු පෙ.ව. 11.01ට පමණ අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.